ප්‍රශ්නය : අවසරයි ස්වාමීන් වහන්ස, ඉතිහාසය දෙස අපි ප්‍රථමයෙන් බලමු. ඉතිහාසයේ සීගිරිය, අනුරාධපුරය, පොළොන්නරුව යුගවලදී අපි විශාල දේවල් නිර්මාණය කර තිබෙනවා. නමුත් අද අපි මේ මට්ටමින් පහතට වැටිලා තියෙනවා. අද අපිට තනිවම කාණුවක්, පාරක් ඉදිකරන්නවත් බැහැ. ඉතිහාසය සමඟ සසඳා බලන විට අපට වෙලා තියෙන්නේ කුමක්ද ?

පිළිතුර : ඔබ සඳහන් කළා වගේම අපේ පැරැණි ඉතිහාසය තුළ ලොව විස්මයට පත් කළ විශිෂ්ට නිර්මාණ කිරීමේ ශක්තියක්, අපේ ශ්‍රමයට හැකියාවක්, නිපුණතාවක් තිබුණා. දාගැබ් නිර්මාණය කිරීමේදී ලොව ප්‍රථම ස්ථානයේ සිටින්නේ අප. එයට දෙවැනි වන කිසිවෙක් නැහැ. වාරි තාක්ෂණය අතින් ඉහළ ස්ථානයක සිටියා. ලෝකයේ මහා වැව් අපි නිර්මාණය කළා. අප තාක්ෂණ මෙවලම් නොතිබුණ යුගයක මිනිසා තම ශ්‍රමයට දුන් වටිනාකම, එසේ නැතිනම් තමන්ගේ රටේ අවශ්‍යතාව හඳුනාගෙන එම අවශ්‍යතාවට ගැලපෙන ආකාරයට වැඩකරන්නට හැකි ශ්‍රමික පිරිසක් අප රට තුළ සිටියා. රටට අවශ්‍ය තාක්ෂණය පිළිබඳ අවබෝධයක් ඇති පිරිසක් සිටියා. ඒ නිසා රටේ ඉහළම තැන සිටින රජුගේ සිට පහළම තැන සිටින පුද්ගලයා දක්වා රටේ අවශ්‍යතාව කුමක්ද කියා හඳුනාගෙන ඒ අනුව ක්‍රියා කරන්න හොඳ සැලැසුමක් තිබුණා.

අපි කෘෂිකාර්මික පසුබිමක ජීවත් වූ ජාතියක්. ඒ නිසා අවශ්‍ය වූයේ ජලය. වාරි කර්මාන්තය. එයට ප්‍රමුඛතාවය ලබුණා. ගංගා, ඇළ මාර්ග, මහා වැව් හදාගෙන තම ජීවනෝපායන්, ආර්ථිකය සකස් කර ගත්තා වගේම ආධ්‍යාත්මික පැත්තත් පෝෂණය කර ගත්තා. ධාතුසේන රජතුමා කලා වැව හදන විට, ඒ ආසන්නයේ ම අවුකන බුදුපිළිමය ඉදිකළා. ඒ වගේම හැම තැනකදීම වැව සමඟ දාගැබ සම්බන්ධව පැවැති බව අපට පෙනෙනවා. මම දකින ආකාරයට 15 වන සියවසේ බටහිර ජාතින් අප ආක්‍රමණය කළාට පසු ගත වූ අවුරුදු පන්සියය තුළ කිසියම් මට්ටමකින් අභිමානය දුරු වෙලා, ඉපැරණි හැකියාවන් කිසියම් ආකාරයකින් මොට වී ගියා. අද බාහිර ලෝකය නැතිව අපට බැහැ. බටහිර තාක්ෂණය අත්‍යවශ්‍යයි. ඒවාට වැඳ වැටිලා. ඒවා නැතිව අපට වැඩ කරන්න බැහැ කියන සංකල්පය අද තියෙන නිසා තමයි මේ තත්ත්වය නිර්මාණය වෙලා තියෙන්නේ.

ප්‍රශ්නය : ඉන්දියාවත් බටහිර ජාතින්ගේ යටත් විජිතයක් ලෙස තිබුණා. නමුත් අද අනන්‍යතාව, සංස්කෘතිය, සාහිත්‍ය ආදිය පාවිච්චි කර ගෝලීයකරණයට ඇතුළු වෙන්න ඉන්දියාවට හැකි වෙලා තිබෙනවා. ඉන්දියාව අද තොරතුරු තාක්ෂණ යුගයේ ඉහළින්ම සිටින රටක්. මෙහි වෙනස කුමක්ද?

පිළිතුර : ඉන්දියාව අපට හොඳ පරමාදර්ශයක් සම්පාදනය කරනවා. ඉන්දියාව අපට වගේම අභිමානවත් ඉතිහාසයක් තියෙන රටක්. ධර්මාශෝකලා සිටි, අශෝක ස්ථම්භය, සාංචි ස්තූපය වැනි නිර්මාණ කළ නිර්මාණශීලි අභිමානවත් ජාතියක්. ඒ අය තමන්ගේ ඉතිහාසය පිළිබඳ හැම මොහොතකම සිටින්නේ අභිමානයෙන්. පාලකයන් ජනතාවට හැම නිදහස් උළෙලකදීම ආයාචනා කරන්නේ "අපේ ඉතිහාසය දෙස බලන්න. එයින් ධෛර්යමත් වන්න. ඒ ධෛර්යයෙන් අනාගතය හදා ගන්න" කියලා. ඔවුන් ඒ අභිමානය ජාතියට ඇති කරනවා.

නිදහසින් පසු ඉන්දියානුවන් ක්‍රියාත්මක වූයේ කිසියම් ජාතික ප්‍රතිපත්තියක් මත. මහත්මා ගාන්ධි, ශ්‍රී නේරු වැනි මහා පරමාදර්ශ චරිත තිබුණා. ඒ පරමාදර්ශී චරිත රටේ අනාගතයට පෙන්වා දුන් දර්ශනය තුළ තමයි, අදත් ඒ අය ගමන් කරන්නේ. අපට වඩා විවිධත්වයක්, ජාතින්ගේ විෂමතාවයක්, ආගමික විෂමතාවයක් ඉන්දියාව තුළ තියෙනවා. ජාතින් හා ආගම් සිය ගණනක් සිටිනවා. නමුත් ඒ සියලු දෙනාව ඉන්දියානු සංස්කෘතියක් තුළ ඒකීයත්වයෙන් ජීවත් වෙනවා. ඒ නිසා අද ලෝකයේ දියුණු තැනකට ඉන්දියාවට එන්න හැකි වෙලා.

නමුත් නිදහසින් පසු ශ්‍රී ලංකාව ගමන් කළේ ඒ ගමන නොවෙයි. අපි අතීතයෙන් අභිමානවත් වෙන්න කල්පනා කළේ නැහැ. අපි තවදුරටත් බටහිර ජාතීන්ගෙන් යැපෙන මට්ටම බවට පත් වුණා. අධ්‍යාපන ක්‍රමය, ආර්ථිකය අපට අවශ්‍ය ආකාරයට සකස් කර ගත්තේ නැහැ. අපේ අනෙකුත් සංස්කෘතික, කලා ශිල්ප ආදිය මතු කළේ නැහැ. අපට එදා නිදහස අහිමි වූ තැනට ගමන් කරන්න අවශ්‍යයි හෝ එදා තිබුණ වටිනාකම් නැවත ඉස්මතු කර ගන්න කල්පනා කළේ නැහැ. ඉන්දියාවට පරමාදර්ශ ගන්න මහා පුරුෂයෝ සිටියා. නමුත් අපට එහෙම සිටියේ නැහැ. අපේ ජාතියේ පියා ඩී.එස්. සේනානායක මැතිතුමා. එතුමා රදළ වලව්කාරයෙකු ලෙස කොළඹට වී සිටින්නේ නැතිව බලය ලැබුණාම ගියේ දිගාමඩුල්ලට, අම්පාරට. එතුමා එහිදී ගල්ඔය ව්‍යාපාරය හැදුවා. මිනිස්සු අදත් ගල්ඔය ව්‍යාපාරයේ පසුබිම ආශ්‍රයෙන් ජීවත් වෙනවා. මිනිස්සු කෘෂි කර්මාන්තය, උක් වගාව කරගෙන ජීවත් වෙනවා.

ප්‍රශ්නය : නේරු අගමැතිතුමාත්, මහත්මා ගාන්ධිතුමාත් අධ්‍යාපනය ලැබීම ආදිය සියලු දේ කළේත්, සියලු අත්දැකීම් ලබා ගත්තේත් බටහිර ලෝකයෙන්. ඔවුන් ඉන්දියානු සමාජයට ඇතුළු වූයේ ඉන් අනතුරුවයි. නමුත් ඔවුන්ට තමන්ගේ අනන්‍යතාව සඳහා කැපවීමක් කරන්න හැකි වුණා. ඉන්දියාවේ අදත් පවතින දර්ශනය පටන් ගත්තේ එතැනින්. මහත්මා ගාන්ධිතුමා ඉන්දියාවේ ආත්මය. ප්‍රතිපත්ති පැත්තෙන් දර්ශනය දුන්නේ ශ්‍රී නේරුතුමා. නමුත් ඔබ වහන්සේ සඳහන් කරන ආකාරයට අපේ රටේ දැක්මක් තියෙන පුද්ගලයෙක්ව සිටියේ ඩී.එස්. සේනානායක මැතිතුමා පමණ ද?

පිළිතුර : අපට ඉන්දියාව ආදර්ශයට ගෙන දර්ශනයක් හදා ගන්න තිබුණා නම් උත්සාහ කළේ ඩී.එස්. සේනානායක මැතිතුමා පමණයි.

ප්‍රශ්නය : තව චරිත බිහි වූයේ නැත්තේ ඇයි?

පිළිතුර : යටත් විජිත පසුබිමේ බිහිවුවත් ඒ අය තුළ රටට ආදරයක් තිබුණා. ඒ අය අපේ සංස්කෘතිය තුළ හැදුණ වැඩුණු, පෝෂණය වුණ මිනිස්සු. ඔවුන් යටත් විජිත පසුබිමේ වුවත් රට බේර ගන්න, රට හදා ගන්න අවශ්‍යයි කියන සංකල්පය තුළ සිටියා. නමුත් ඊට පසු අනාගත දර්ශනයක් සහිත නායකයන් බිහි වූයේ නැහැ.

ප්‍රශ්නය : ස්වාධීනත්වය, නිදහස ලබා ගන්න ඉන්දියාවට සටනක් කරන්න සිදුවුණා කියා සඳහන් වෙනවා. එයට නායකත්වය ලබා දුන්නේ ගාන්ධිතුමා, ශ්‍රී නේරුතුමා වැනි නායකයින්. ඔවුන් අවුරුදු ගණනාවක් ඒ වෙනුවෙන් සිරගත වෙලා සිටියා. නමුත් අපට නිදහස ඉතාමත් ලෙහෙසියෙන් ලැබුණා.

පිළිතුර : ඒ අදහසට මා එකඟ වෙනවා. ඉන්දියාවේ නිදහස ජාතියේ ලේ වලට කැවිලා තියෙන එක දෙයක්. නිදහස ලබා ගත්තේ බොහෝ වෙහෙස මහන්සි වෙලා. ගාන්ධිතුමා විශාල සටනක් දුන්නා. එමගින් සියලු දෙනාට ලබා දුන්න පණිවුඩයක් තිබුණා "අපි සියලුදෙනාම ඉන්දියානුවන් වෙලා මේ අභියෝගය ජයගමු" කියලා. අපට එය තිබුණේ නැහැ. අපි සීතල කාමරවල සිට නිදහස දිනා ගත් ජාතියක්. ඒ නිසා අපට නිදහස අහිමි වූ කාලයයි, නිදහස හිමි වූ කාලයයි කියලා වෙනසක් දැනුනේ නැහැ. නමුත් ඉන්දිය ජාතිකයන්ට අදත් තියෙනවා, අභියෝගයට පසුව රට හදාගෙන ඉදිරියට යා යුතුයි කියන අදහස. එය අනාගතයටත් තියෙනවා. ඉන්දියාව නිදහසින් පසුව තම රාජ්‍ය ලාංඡනය බවට පත් කර ගත්තේ බොහෝම ඓතිහාසික නිර්මාණයක්. ධර්මාශෝක රජතුමා විසින් ලුම්බිණියේ ඉදිකර ඇති අශෝක ස්ථම්භයෙන් තමයි රාජ්‍ය ලාංඡනය නිර්මාණය කළේ. එය දකින හැම ඉන්දියානුවෙකුටම තමන්ගේ ඉතිහාසය පිළිබඳ අභිමානයක් ඇති වෙනවා. අඩුම වශයෙන් අපේ ඉතිහාසය පරමාදර්ශ කරගෙන අපේ රාජ්‍ය ලාංඡනයවත් නිර්මාණය කරගන්න අපට නොහැකි වුවා. වර්තමානයේ මේ බේදවාචකයට හේතු වෙලා තියෙන්නේ එසේ ඉන්දියානුවාට ඔහුගේ ඉතිහාසය පිළිබඳ තිබෙන අභිමානය අපේ පාලකයන්, ප්‍රතිපත්ති සම්පාදකයන් අපේ ජාතියට ලබා නොදුන් එක තමයි.

ප්‍රශ්නය : මෙම නිදහස ලැබුණත්, එසේ නිදහස ලැබුණේ එක පංතියකට පමණක් වෙන්න පුළුවන් නේද? සමාජය තවමත් ඉන්නේ වහල් වෙලා.

පිළිතුර : ඩී. එස්. සේනානායක මැතිතුමා ප්‍රධාන වූ සුළු පිරිසක් ගෙනගිය ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස නිදහස ලැබුණා. එහෙම නැතිව පෙළපාලි ගිහිල්ලා, සටන් කරලා නෙමෙයි. නමුත් එස්. මහින්ද හාමුදුරුවෝ නිදහස ගැන අප දැනුවත් කළා. පියදාස සිරිසේන මහතා වැනි අය මේ පිළිබඳ ලියලා කියලා දුන්නා. ධර්මපාලතුමා එක පැත්තකින් මේ සටන අරගෙන ගියා. හැබැයි මේ සඳහා ජනතාවගේ සෘජු සහභාගිත්වය, මැදිහත්වීමක් තිබුණේ නැහැ. ධර්මපාලතුමා මේ සටන කළේ තනිවම. ඒ සඳහා ජනතාවගේ සහභාගීත්වය නොලැබුණ නිසා නැවත මේ රටේ ඉපදෙන්නවත් කල්පනා කරන්නේ නැතිව ඉන්දියාවට ගිහිල්ල පැවිදි වෙලා අපවත් වුණා. ඒ නිසා නිදහස සඳහා ඉන්දියාවේ වගේ පුළුල් ජන සහභාගිත්වයක් ඇති වුණේ නැහැ. එහෙම ඇති නොවන නිසා ඊට පසු පරම්පරාවල්වලට මෙය වැදගත් වූයේ නැහැ.

ප්‍රශ්නය : ඔබ වහන්සේ අධ්‍යාපනය පිළිබඳ සඳහන් කළා. මේ ගමන් මඟ වෙනස් කරන්න නම් අධ්‍යාපනයෙන් ආරම්භ කරන්න සිදු වෙනවා. ඔබ වහන්සේගේ අත්දැකීම් අනුව අධ්‍යාපන ක්‍රමය ගැලපෙන පරිදි සම්පූර්ණයෙන් වෙනස් කරන්න නම් කළ යුතු මොනවාද?

පිළිතුර : සාමාන්‍ය පෙළ, උසස් පෙළ හා සරසවි අධ්‍යාපනය කියලා අපේ අධ්‍යාපනයේ මූලික වශයෙන් පියවර තුනයි. මේ සඳහා විශාල වශයෙන් මුදලක් රජය ආයෝජනය කරනවා. නිල ඇඳුම්, පොත් පත් වගේ දෙවල් ලබා දෙනවා. අපේ රටේ විශ්ව විද්‍යාල අධ්‍යාපනය පවා නොමිලේ. නමුත් අවසාන වශයෙන් උපාධි සහතිකය අරගෙන රැකියාවක් ලබා ගන්න හන්දි ගානේ උපවාස කරන තත්ත්වයට පත් වෙලා. වර්තමානයේ මේ විසඳුවා කියන රැකියා ප්‍රශ්නයේදි කරන්නේත් උපාධිධාරියා හෝද හෝද මඩට දමන එකයි. උපාධිධාරීන් තමයි අපේ රටේ බුද්ධිමතුන්. පළමු ශ්‍රේණියේ සිට ගමනක් ඇවිල්ලා විශ්වවිද්‍යාල අධ්‍යාපනයත් ලබලා, එළියට එන්නේ මේ රටේ බුද්ධිමතුන් පිරිස. බුද්ධිමත් කෙනෙකුට අභිමානයෙන් රැකියාවකට යන්න පරිසරයක් අවශ්‍යයි. නමුත් අධ්‍යාපනය මුල සිටම ඒ සඳහා සැකසිලා නැහැ. සාමාන්‍ය පෙළ විභාගයට විෂයයන් දහයක් ඉගෙන ගන්න අවශ්‍යයි. ඒ විෂයයන් දහය ඉගැන්වීමට රජය විශාල මුදලක් අයෝජනය කරනවා. පොත්පත් විශාල ප්‍රමාණයක් හදලා දීලා ඒවා කරේ එල්ලගෙන ළමයි පාසැල් පිටත් කරනවා. එතකොට පන් ලක්ෂයක් පමණ විභාගයට ඉදිරිපත් වෙනවා. එයින් එක් ලක්ෂයක් පමණ තමයි උසස් පෙළට එන්නේ. අනෙක් හාර ලක්ෂයම අසමත් වෙනවා. ඒ හාර ලක්ෂයටම අර ඉගෙනගත් විෂයයන් දහයෙන්ම වැඩක් වෙන්නේ නැහැ. රැකියාවක්, ව්‍යාපාරයක්, තමන්ගේ ජීවනෝපායයක් කර ගන්න බැහැ. ඒ නිසා අධ්‍යාපනය රටේ සංස්කෘතිය, ඉතිහාසය ඇති කරනවා වගේම දරුවන්ගේ පෞරුෂයත් හදන්න අවශ්‍යයි. අනෙක් කරුණ අධ්‍යාපනය තුළින් ජීවිතය හදා ගන්න අවශ්‍යයි. අපේ අධ්‍යාපනයේ පළමු පියවර තුළම ඒ කිසිවක් වෙන්නේ නැහැ. දෙවැනි පියවරේදීත් එය වෙන්නේ නැහැ. දෙලක්ෂ පනස් දහසක් උසස් පෙළ විභාගය සඳහා ඉදිරිපත් වෙනවා. එයින් විශ්වවිද්‍යාලයට ගන්නේ ඉතාම සුළු පිරිසක් තමයි. ඉතිරි අයට යන එන මං නැහැ. ඒ අයට තමන් ඉගෙන ගත් විෂයයන් තුන හතරෙන් කිසිම දෙයක් කරන්න බැහැ. විශ්ව විද්‍යාලයේදී නීතිය, ඉංජිනේරු විද්‍යාව හෝ වෛද්‍ය විද්‍යා විෂයයන් හදාරලා එළියට එන ඉතාම සුළු පිරිසට හැරෙන්නට අනෙක් විෂයයන් ඉගෙනගෙන එන දරුවන්ට රැකියාවක් කරන්න අවශ්‍ය ජීවන කුසලතා දියුණු වන අධ්‍යාපනයක් අපේ රටේ නැහැ.

ප්‍රශ්නය : ඒ සඳහා කළ යුත්තේ කුමක්ද?

පිළිතුර : හැම පුද්ගලයාම උපදින්නේ කිසියම් හැකියාවක් ඇතිව. ඒ නිසා අපේ අධ්‍යාපනය තුළ ප්‍රාථමික අවස්ථාවේදීම ඒ හැකියාව හඳුනාගත යුතුයි. වෙන වෙන දේ නැතිව නොවෙයි. ඒ හැකියාව ඉහළට දියුණු කරගෙන යා හැකි වන අධ්‍යාපන රටාවක් රටට අවශ්‍යයි. ගණිතයට දක්ෂ කෙනාට ගණිතය දියුණු කරගෙන යන්න, මෝටර් කාර්මික කටයුතු සඳහා දක්ෂ අයට ඒ පැත්තෙන් යන්න, වතු වගාව, ගොවිතැන, කෘෂිකර්මය දක්ෂ අයට, ඒ පැත්තෙන් දියුණු වෙන්න අවස්ථාව ලබා දෙන්න අවශ්‍යයි. ඉතාම අඩු ශිෂ්‍ය පිරිසක් තමයි කෘෂිකර්මය විෂයන් හදාරන්නේ. අපට අවශ්‍යම දෙය අපි කරන්නේ නැහැ. නමුත් පරිගණක තාක්ෂණය පළමු ශ්‍රේණියේ සිටම උගන්වන්න කටයුතු කරනවා. පටන් ගන්නේ වැරදි තැනකින්. පරිගණක තාක්ෂණය අවශ්‍යයි. අද එය නැතිව කිසිවක් කරන්න බැහැ. නමුත් එයට ප්‍රමුඛතාවය ලබා දෙන්නේ නැතිව ප්‍රාථමික අධ්‍යාපනයේදී ලබාදිය යුතු බොහෝ දේ තියෙනවා.

නිදහසින් පසු අපේ රටේ අධ්‍යාපනයට කිසිම දර්ශනයක් ඇති වුණේ නැහැ. ආණ්ඩුවෙන් ආණ්ඩුවට ප්‍රතිපත්ති වෙනස් වෙනවා. මේ සාරධර්ම හෝදා පාලුවට හැත්ත දෙකේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය විශාල වශයෙන් වගකිව යුතුයි. එහිදී අප ප්‍රජාචාරය, සාහිත්‍ය වැනි දෙවල් පැත්තකට දැම්මා. ප්‍රජාචාරය කියන්නේ අප ජීවත් වෙන වටපිටාව හැදෑරීම. මිනිසුන්ගේ මනස, හදවත පෝෂණය කරන්නේ සාහිත්‍යයෙන්. ඉතිහාසය විෂයක් වශයෙන් තිබුණා. ඒකත් පැත්තකට දැම්මා. වෙන වෙන විෂයන් විශාල ප්‍රමාණයක් හඳුන්වා දුන්නා. හැත්තෑ දෙකෙන් පස්සේ සාහිත්‍යයට, ඉතිහාසයට තිබුණ තැන අහිමි කළ නිසා මුල් ගැලවී ගිය, නිර්වින්දනය කළ පරපුරක් තමයි බිහි වෙලා තියෙන්නේ. ඒ අයට රට ගැන ආදරයක් නැහැ. පසුගිය පොසොන් සමයේදී අනුරාධපුරයට ගිය ඇතැම් අය ගල් කණු ළඟ ළිප් හදාගෙන ආහාර පිස කා බී විනෝද වෙනවා අපි දැක්කා. එහෙම ජාතියක් බවට අපි අද පත් වෙලා. ගල් කණුවක් ළඟට ගිහිල්ලා අපි වැඳ වැටෙන්න අවශ්‍යයි. මන්ද පසුබිමේ ඉන්නේ අපේ රටේ සිටි ශ්‍රේෂ්ඨ නිර්මාණ ශිල්පීන්. ඉවසීමක් ඇති අපේ ශ්‍රේෂ්ඨ

සිංහලයන්. ඒ දෙස බලලා අපි වළින්න අවශ්‍යයි. දැන් මිනිස්සු එතැන ලිප් බැඳ ගෙන ආහාර පිසලා කාලා එන තත්ත්වයට පිරිහීම කණගාටුවට කරුණක්.

ප්‍රශ්නය : ඔබ වහන්සේ සඳහන් කළා වගේ දේශීය හෝ විදේශීය වශයෙන් දැන් වඩු, මෝටර් කාර්මික, මේසන් ආදී වෘත්තීන්ගෙන් බොහෝ ආදායම් ලබා ගන්න පුළුවන්. හොඳට වඩු වැඩ දන්න පුද්ගලයෙකුට පුද්ගලික අංශයේ කළමනාකරුවෙක් ලබා ගන්නා තරමේ ආදායමක් ලබා ගන්න හැකියි. නමුත් අපේ ආකල්ප වෙනස් වෙලා නැහැ. ශ්‍රමයට අභිමානයක් කියන එක නැහැ. එයට ඇතුළු වෙන්න සමාජය අකමැතියි. මේ තත්ත්වයට කරන්න පුළුවන් කුමක්ද?

පිළිතුර : ශ්‍රමාභිමානය කියලා හොඳම වචනය ඔබතුමා පාවිච්චි කළා. බුදු සමයේ ශ්‍රමයට ලබා දුන් වචනය තමයි ශ්‍රම අභිමානය කියන එක. හැම කෙනාගේම ශ්‍රමය වටිනවා. වෛද්‍යවරයාගේ වගේම කම්කරුවාගේ ශ්‍රමයටත් අභිමානයක් තියෙනවා. නමුත් අපේ රටේ ඒ අභිමානය නිසි ලෙස ලබා දී නැහැ. අධ්‍යාපන ක්ෂේත්‍රය තුළදී ඒවාට අඩු සැලකිල්ලක් දක්වලා තියෙන්නේ, ඒ නිසා තමයි. සුනාමි ව්‍යසනයෙන් පසු අපේ රටේ කඩා වැටුණ ගෙවල්, පාරවල් හදන්න අවශ්‍ය ශ්‍රමිකයෝ අපට නැති වුණේ ඒ නිසයි. දවස් දෙක තුනෙන් මේ සඳහා ශ්‍රමිකයෝ නිර්මාණය කරන්න සිදු වුණා. පංති, පාඨමාලා පවත්වලා වඩු කාර්මිකයන් හදන්න සිදු වුණා. සාමාන්‍ය පෙළ විභාගයට පෙර අවුරුදු එකොළහ තුළ ලබා ගත් අධ්‍යාපනය තුළ ඔහුට පෙදරේරු, වඩු, මෝටර් කාර්මික වැනි විෂයයන් කිහිපයක දැනුම ලැබුණ නම් එහෙම වෙන්නේ නැහැ. ඒ විෂයයන් හදාරා පාසලෙන් ගෙදර ගිය පසු ඔහුට බය නැතිව, ආණ්ඩුවට බරක් නැතිව, පොඩි වැඩපළක් දමාගෙන තමාගේ ජීවිකාව ගොඩනගා ගන්න හැකි වෙනවා. නමුත් අපේ රටේ නිදහසින් පසු රජයේ රැකියාව සඳහා පමණයි අභිමානය ඇති කරලා තියෙන්නේ. අනෙක් ශ්‍රමිකයන් ගැන කිසිම අභිමානයක් නැහැ. ඔහු සමාජයේ පහත් පුද්ගලයෙකු ලෙස තමයි සලකන්නේ. ඒ නිසා ඔහු ඉදිරියට ගන්න, ඔහුට දිරි දෙන්න අපේ රටේ කිසිම ආයතනයක සැලැස්මක් නැහැ.

ප්‍රශ්නය : බටහිර ලෝකයේ හැම ක්ෂේත්‍රයකටම ගරු කරනවා. ඉන්දියාවේ පවා මේ දේ සිදු වෙනවා. සමහර කටයුතු කර ගන්න බංගලාදේශයෙන් හෝ චිනයෙන් පුද්ගලයන් ගෙනෙන්න සිදු වී තිබෙනවා. මේ ආකල්ප වෙනස් කිරීම පටන් ගන්න පුළුවන් වන්නේ කොතැනින්ද ?

පිළිතුර : ප්‍රථමයෙන් අපේ රටේ අධ්‍යාපන ප්‍රතිපත්ති වෙනස් විය යුතුයි. ඒ සඳහා හොඳ අධ්‍යාපනඥයෙකුගේ දර්ශනය අවශ්‍ය වෙනවා. කන්නන්ගර මැතිතුමා ලබා දුන් දර්ශනය තුළ කොයි තරම් වටිනා ගමනක් අපි පැමිණියාද? ගම්වල සිට දරුවෝ මධ්‍ය මහා විද්‍යාල හරහා සමාජයට ගත්තේ ඒ දර්ශනයයි. කන්නන්ගර මැතිතුමා දැක්කා අනාගතයේදි මේ රටට කරන්න අවශ්‍ය කුමක් ද කියලා. එවැනි ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකුගේ චරිතය පිළිබඳවවත් අපි දන්නේ නැහැ. ඒ නිසා මේ අධ්‍යාපනය නිවැරදි තැනට ගෙන එන්න අපට අවශ්‍ය වන්නේ කන්නන්ගර කෙනෙකුගේ පුනරාගමනයයි.

ප්‍රශ්නය : ජපානයේ, චීනයේ, ඉන්දියාවේ සමාජය තමාගේ භාෂාව ගැන ආඩම්බරයි. ඉංග්‍රීසි භාෂාව ගැන අවබෝධයක් නැතිනම් පරිවර්තනයක් හරහා ඒ පිළිබඳ අවබෝධය ලබා ගන්නවා. චීනයේ, ජපානයේ නායකයන් කතා කරන්නේ තමන්ගේ භාෂාවෙන්. නමුත් ලංකාවේ අයට තමන්ගේ භාෂාව ගැන ලැජ්ජාවක් තියෙනවා. ඉංග්‍රීසි භාෂාව ගැන දැන ගන්න අවශ්‍යයි. නමුත් තමන්ගේ භාෂාව ගැන ලැජ්ජා වෙන්න දෙයක් නැහැ. අපිට එතැනත් ප්‍රශ්නයක් තියෙනවා නේද?

පිළිතුර : මෙය සාකච්ඡා කළ යුතු ඉතාම වැදගත් ප්‍රශ්නයක්. ආනාගතයේ සිංහල භාෂාව කතා කරන ජන පිරිසක් නැති වුණ කාලයක සිංහල කියලා ජනවර්ගයක් මේ රටේ පවතින්නේ නැහැ. අපි කියන්නේ අපිට අවුරුදු පන්දහසක ඉතිහාසයක් තියෙනවා කියලා. ඉතා පැහැදිලිව අවුරුදු දෙදහස් පන්සියයක ඉතිහාසයක් තියෙනවා. ඉන් එහාත් අපේ රටේ මිනිස්සු සිටියා. ඒ නිසා මේ අවුරුදු පන්දහස තිස්සේ වර්ධනය වූ ජාතිය තවත් අවුරුදු හාරපන්දහසක් ඉදිරියට යන්නේ සිංහල භාෂාව කතා කරන ජන වර්ගයක් අපේ රටේ සිටියහොත් පමණයි. අද දවසේ ඉතාම පැහැදිලිව භාෂාවට තියෙන අභිමානය අධ්‍යාපනය තුළම නැති කරලා. මිහිඳු හාමුදුරුවන් වැඩියට පස්සේ අපිට ගුරුළුගෝමීලා, විද්‍යාචක්‍රවර්තිලා, ධර්මසේන, බුද්ධපුත්‍ර වැනි හාමුදුරුවන් වහසේලා, නූතනයේ මාටින් වික්‍රමසිංහලා, මහාචාර්ය ඩී.ඊ. හෙට්ටිආරච්චිලා, ගුණපාල මලලසේකරලා කොතරම් ලස්සනට මේ භාෂාව සකස් කරලා දී තිබෙනවාද? මේ භාෂාව කතා කරන ලෝකයේ එකම ජන කොට්ඨාසය අපි. මේ රටේ පමණයි. ලෝකයේ වෙන කොහේවත් නැහැ. අපි මේ

භාෂාවෙන් ඈත්වෙනවා කියන්නේ අපේ ජාතියේ විනාශයේ ආරම්භයි. එය දැන් නිර්මාණය වෙලා. කන්නන්ගර මැතිතුමා යෝජනා කළේ ස්වභාෂා අධ්‍යාපනය සමඟ දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි පළමු වන ශ්‍රේණියේ සිටම උගන්වන්න කියලා. ඒක අපේ රටේ අධ්‍යාපනයේදී ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ නිසා එතෙක් තිබූ ද්විභාෂා අධ්‍යාපනය කඩා වැටිලා ස්වභාෂාවෙන් පමණක් ඉගෙන ගත්තා. ඉංග්‍රීසි භාෂාව නැතිව. අද ඒ සිංහල උගත් පිරිසට ඉංග්‍රීසි නැතිව කිසිම දෙයක් කර ගන්න බැහැ කියන හැඟීම ඇති වෙලා. ඒ නිසා නූතන දෙමාපියන් තමන්ගේ දරුවන්ට ඒ ඉරණම අත් වෙන්න දෙන්නේ නැතිව වැඩකටයුතු කරනවා. ජාත්‍යන්තර පාසල්වලට යවලා ඉංග්‍රීසි උගන්නවනවා. දහම් පාසලට එවන්නේ ඉංග්‍රීසි උගන්වනවානම් පමණයි. අධ්‍යාපන අමාත්‍යාංශය හරහාත් උත්සාහ කළා උසස් පෙළ විද්‍යා විෂයයන් ඉංග්‍රීසියෙන් උගන්නවන්න. හයවන ශ්‍රේණියේ සිට පටන් ගන්න අවශ්‍යයි කියලා කියනවා. 2006 දී පළමු ශ්‍රේණියේ සිට ගුරුවරයා සිංහල උගන්නවන විට ඒ හැම සිංහල වචනයකටම ඉදිරියෙන් ඉංග්‍රීසි වචනයකුත් දෙන්න අවශ්‍යයි කියලා ගුරුවරු පුහුණු කරලා තියෙනවා. නමුත් කරන්න අවශ්‍ය වන්නේ මෙය නෙමෙයි. ඉංග්‍රීසිත් සමඟ සිංහල හොඳට උගන්වන්න අවශ්‍යයි.

සිංහල ඉගෙන ගැනීම, කතා කිරීම, ලිවීම ලජ්ජාවට කාරණයක් වෙලා. තමන්ගේ භාෂාව ගැන අභිමානයක් නැති ජාතිය බරපතළ විනාශයකට හේතුවක්. හතු පිපෙන්නා වගේ නිර්මාණය වන ජාත්‍යන්තර පාසල් වල මව් බස ඉගෙන ගන්නේ නැහැ. ඒ අය ඉගෙන ගන්නේ වෙන භාෂාවක්. වෙන ඉතිහාසයක්. තව අවුරුදු දහයකින් පහළොවකින් ඔය ජාත්‍යන්තර පාසල්වල ඉගෙන ගන්න ශිෂ්‍යයෝ එළියට ඇවිල්ලා සමාජයේ වගකිව යුතු අය බවට පත් වූ පසු ඔවුන් කතා කරන්නේ සිංහලයෙන් නෙමෙයි. අපේ ඉතිහාසය ගැන නෙමෙයි. ඔවුන් බටහිර සංස්කෘතියට හැඩ ගැසුණු පිරිසක්. එවිට රටට අත්වන ඉරණම කුමක් කියලා නූතන අධ්‍යාපනඥයන්ට, බුද්ධිමතුන්ට, වගකිව යුත්තන්ට පෙනෙන්නේ නැති එක විශාල ඛේදවාචකයක්.

ප්‍රශ්නය : මෙය පැති දෙකක් තියෙනවා. එක පැත්තකින් ඉංග්‍රීසි භාෂාවට සම්පූර්ණයෙන් වහල් වෙනවා. නැතිනම් වෛරයෙන් ඉංග්‍රීසි භාෂාව දෙස බලනවා. ඔය දෙකම එකට ගෙනියන්න පුළුවන් කොහොමද කියන එක ගැන අපි බලන්නේ නැහැ.

පිළිතුර : ඒක හරි. කන්නන්ගර මැතිතුමාගේ යෝජනාව අදට ගෙනෙනවානම් කිසිම ගැටලුවක් ඇති වන්නේ නැහැ. හොඳ ඉංග්‍රීසි ගුරුවරු ටිකක් හදලා, පළමු වන ශ්‍රේණියේ සිංහල ගුරුවරයා සිංහල උගන්නවනවා වගේම ඉංග්‍රීසි ගුරුවරයා ඉංග්‍රීසි උගන්වන්න අවශ්‍යයි. එවිට නැවත අමුතුවෙන් භාෂා මාධ්‍ය වෙනස් කරන්න අවශ්‍ය වන්නේ නැහැ. එතකොට ඔහු සිංහල භාෂාවයි, ඉංග්‍රීසි භාෂාවයි දෙකම ඉගෙන ගන්නවා. ජාත්‍යන්තර පාසල් වලට යන ශිෂ්‍යයෝ අපේ දහම් පාසලේම ඉන්නවා. ඒ අයට සිංහල වචනයක් බැහැ. පැත්තකට වෙලා ඉන්නවා. සිංහල වචනයක් ලියන්නත්, කියන්නත් බැහැ. මෙය කොතරම් අවාසනාවන්ත තත්ත්වයක්ද?

ප්‍රශ්නය : යුරෝපයේ නිතරම මූලිකත්ව දෙන්නේ තමන්ගේ භාෂාව උගන්නවන්න. ඊට අමතරව ළමයි ඉංග්‍රීසි හෝ ප්‍රංශ භාෂාව ඉගෙන ගන්නවා වෙනත් කටයුතු සඳහා. තමන්ගේ භාෂාව අමතක කරන්නේ නැහැ. භාෂා දෙකම එක සේ ඉගෙන ගන්නවා. චීනයේ වුවත් කරන්නේ මේ දෙය. චීන වගේම ඉංග්‍රීසිත් හොඳට කතා කරන එක පරම්පරාවක් දැන් බිහි වෙලා තියෙනවා. ඉන්දියාවේත් මෙය සිදු වෙනවා. නමුත් අපේ රටේ හරියට ඉංග්‍රීසි කතා නොකෙරුවොත් විශාල මදිකමක් ලෙස සලකනවා. භාෂාව කියන එක පංති ප්‍රශ්නයක් ලෙස සකස් වෙලා. ''කඩුව'' කියන වචනය භාවිත වන්නේත් ඒ නිසයි.

පිළිතුර : ඔව්, දැනටම ඒ පංති භේදය නිර්මාණය වෙලා. නිදහස් අධ්‍යාපන ක්‍රමය එන විට ගමට අධ්‍යාපනය සිංහල පමණක් වුණා. නගරයට සිංහල ඉංග්‍රීසි දෙකම පැමිණියා. ඒ නිසා ඒ විෂමතාව මතු වුණා. වර්තමානයේ මොණරාගල වාගේ පිටිසරත් ජාත්‍යන්තර පාසල් තියෙනවා. ඒ නිසා ගමෙත් මේ හරහා පංති භේදය ගොඩනැගෙනවා. සමාජය බෙදෙනවා. ඒ බෙදීම විශාල ගැටලුවක්. මම කළින් සඳහන් කළා වගේ අපිට ජාතක පොත් වහන්සේ, සද්ධර්ම රත්නාවලිය, පූජාවලිය, අමාවතුර වාගේ මහා සාහිත්‍යයක් තියෙනවා. ලෝකයේ රටකට තමන්ගේ සාහිත්‍යය වටිනා සම්පතක්. සාහිත්‍යයක් නැති ජාතීන් දුක් වෙනවා. නමුත් අපට කිසිම රටකට නොදෙවනි දැවැන්ත සාහිත්‍යය සම්ප්‍රදායක් තියෙනවා. මේ සියල්ලම හොඳ සිංහල වහරින් නිර්මාණය වූ දේ. අපි ජාතක පොතෙන් හැදුණ ජාතියක්. ජාතක කතාවල තියෙන්නේ මානුෂික ධර්ම පිළිබඳව. මිනිස්සු කොහොමද අභියෝගවලට මුහුණ දී ජීවත් වෙන්නේ කියලා, ඒවායෙහි සඳහන් වෙනවා. මේ

ගැඹුරු සිංහල සංස්කෘතික භාෂා දැනුම නොමැති වීම නිසා ඒවා දැන් ජනතාව අතරට යන්නේ නැහැ. ඒ නිසා අපි අපේ සාහිත්‍ය පැත්තකට දමලා ඉංග්‍රීසි සාහිත්‍යය පැත්තට ගමන් කරනවා. මෙයින් කියන්නේ ඉංග්‍රීසි සාහිත්‍යය අනවශ්‍යයි කියන එක නෙමෙයි. එයින් යම් දෙයක් ලබා ගන්න පුළුවන්. නමුත් අපේ මහා සාහිත්‍යය සම්ප්‍රදායට පයින් ගහලා, ඒවා බැහැරට දමලා අපට අනාගතයට යන්න හැකියාවක් නැහැ.

ප්‍රශ්නය : ආර්ථිකයක් වුවත්, තමන්ගේ විශ්වාසය, ආත්ම ශක්තිය හදාගන්නේ නැතිව නිර්මාණය කරන්න බැහැ. එය හැදෙන්නේ තමන්ගේ අනන්‍යතාවයෙන් හා සංස්කෘතියෙන්. ඔබ වහන්සේ සඳහන් කළා වගේ ඩුබායි රටේ විශාල ඉතිහාසයක් නැහැ. තියෙන්නේ අවුරුදු පනහක පමණ ඉතිහාසයක්. දැන් ඔවුන් ඉතිහාසයක් නිර්මාණය කරනවා. සිංගප්පූරුවේත් වෙන්නේ ඒ දෙය. තමන්ගේ ශක්තිය එන්නේ තමන්ගේ ඉතිහාසයෙන් කියලා ඔවුන්ට තේරුම් ගිහින්. අපට මෙතරම් විශාල ඉතිහාසයක් තිබිලත් ඒ දෙය අවබෝධ වෙලා නැහැ.

පිළිතුර : සීගිරියේ කුරුටු ගී ඉතාම වටිනා දෙයක්. හත්වන අටවන සියවසේ සිටි අපේ රටේ මිනිසුන්ගේ රසඥතාව පවා ප්‍රකට වන්නේ සීගිරි කුරුටු ගීයෙන්. මේවා කළේ මහා කවියෝ නෙමෙයි. මේවා කළේ ගම්වල සිටි පොදු ජනතාව. ඈත ගම්වල සිට සීගිරිය බලන්න ආව මිනිස්සු තමන්ගේ හැඟීම පුංචි ප්‍රකාශනයට ගැබ් කළා. ඒ ප්‍රකාශයක අසභ්‍ය, රසඥතාවකට යන කිසිවක් නැහැ. ඒ නිසා ක්‍රිස්තු වර්ෂ හත්වන, හයවන සියවස්වල පවා අපට හොඳ වින්දන ශක්තියක් තිබුණ බව පෙනෙනවා. අද වර්තමාන පාසල් ශිෂ්‍යයන් පවා සීගිරි කැටපත් පවුරේ ඉතා බොළඳ කුරුටු ගී ලියලා අහුවෙලා හිරේ දැම්මා. එය නූතනයාට වෙලා තියෙන දෙය. නූතනයා ඒවා ගැන නොසලකා හරිනවා. ඇත්ත වශයෙන්ම මෙය දරුවන්ගේ වැරැද්ද නොවෙයි. මේ රටේ ප්‍රතිපත්ති හදන අයගේ වැරැද්ද.

ප්‍රශ්නය : ලෝකයේ රටවලින් අපේ ඉතිහාසය බලන්න පැමිණෙන සංචාරකයන් අපේ ආර්ථිකයට හොඳයි. නමුත් ඊට අමතරව අපට ඔවුන් නිසා යම් හානියක් වෙනවා කියා ඔබ වහන්සේට පෙනෙනවාද?

පිළිතුරු : නැහැ. සංචාරක කර්මාන්තය කියන්නේ අපට විශාල ආදායමක් ලබා දෙන දෙයක්. ඒ සංචාරකයෝ එන්නේ කැලේ ඇවිදින්න නෙමෙයි. අපේ අනුරාධපුරයේ සිද්ධස්ථාන බලන්න. රුහුණේ ඇති දේවල් බලන්න. අපේ අභිමානය ලෝකයට ගෙනයන්න සංචාරක කර්මාන්තය ඉතා හොඳ දෙයක්. නමුත් එය හොඳ රාජ්‍ය මැදිහත්වීමකින් කෙරෙන්න අවශ්‍යයි. ඒ එන සංචාරකයාට ඔහු සමඟ යන මාර්ගෝපදේශකයා අපේ ඉතිහාසය ගැන කියලා දෙන්නේ කුමක්ද? ඒ පිළිබඳ මාර්ගෝපදේශකයාට කිසිම අවබෝධයක් නැහැ. ඇයි සංචාරක කර්මාන්තය විශ්වවිද්‍යාලයේ විෂයයක් බවට පත් කරන්නේ නැත්තේ. විශ්ව විද්‍යාලයේදී ඒ ශිෂ්‍යයෝ ඉතිහාසය සමඟ සංචාරක කර්මාන්තය පිළිබඳ ඉගෙන ගන්නවානම්, සංචාරක මණ්ඩලයේ මාර්ගෝපදේශකයෙකු බවට පත්වන ඔහු ජේතවනාරාමය, අවුකන පිළිබඳ හොඳ අවබෝධයක් ලබා ගන්නවා. විදේශීය සංචාරකයෝ පැමිණෙන්නේ අපේ ඒ දේවල් නරඹන්න. එමගින් හොඳ අවබෝධයක් ලබාගන්න. ඒ මගින් අපේ ආර්ථිකය සරුසාර කරගන්නත්, අපේ අනන්‍යතාවය ලෝකයට දෙන්නත් පුළුවන්. පාලනයකින් තොරව සිදු කරන නිසා සමාජ අපචාර, මත්ද්‍රව්‍ය, මත්කුඩු සහ ගණිකා ව්‍යාපාර ආදිය අපේ රටේ නිර්මාණය වෙලා. විවෘත ආර්ථිකය තුළ සෑම දෙයක්ම නිදහසේ, රාජ්‍ය මැදිහත් වීමකින් තොරව අවස්ථාව ලබා දුන් නිසා මේ තත්ත්වය ඇති වෙලා.

ප්‍රශ්නය : ඔබ වහන්සේ උසස් අධ්‍යාපනය සම්බන්ධයෙන් අදහස් රාශියක් මතු කළා. ඔබ වහන්සේ විශ්ව විද්‍යාලයේ ආචාර්ය මණ්ඩලයේ සිටින නිසා මේ අදහස් ඇතුළු කරන්න නොහැකි ඇයි?

පිළිතුර : විශ්ව විද්‍යාලයක ගුරුවරයෙකු වූ පමණින් මේවා වෙනස් කරන්න බැහැ. අපි හැම විටකම මේවා යෝජනා කරනවා. ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිය පාලනය කරන්නේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා ඇති විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂම මගින්. හැම තීරණයක් ගන්නේ, විශ්වවිද්‍යාල පැවැත්ම පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදකයන් බවට පත් වන්නේ කොමිසමයි. ඒ නිසා ආචාර්ය මණ්ඩලවලින් එන අදහස් ඉහළට ගමන් කරලා ඒවා ක්‍රියාත්මක කරන පසුබිමක් නිර්මාණය වෙලා නැහැ. ඒ අයට අවශ්‍ය දේ විශ්වවිද්‍යාලය තුළට කවනවා මිසක්, විශ්වවිද්‍යාල මට්ටමින් ඉහළට අදහස් අරගෙන ක්‍රියාත්මක කරන වැඩපිළිවෙළක් නැහැ.

ප්‍රශ්නය : අවසාන වශයෙන් ඔබ වහන්සේ එක දෙයක් තියනවා නම් අපේ රටේ නායකයන්ට හරියට කරන්න කියලා උපදෙස් දෙන්න. ඒ දෙය කුමක්ද?

පිළිතුර : අපේ රට විනාශයට ගෙන ගිහින් තියෙන්නේ මේ බලය පිළිබඳ උවමනාවට වඩා හඹාගෙන යන දේශපාලනය. වියත් උගත් පරම්පරාව අද දේශපාලනය තුළින් ඉවත් වෙලා. වියත්, උගත් කෙනෙකුට දේශපාලනට එන්නට නොහැකි වෙලා. දේශපාලන ව්‍යුහය ජරාජීර්ණය වෙලා. මේ ජාරාජීර්ණය වූ දේශපාලන ව්‍යුහය වහාම ප්‍රතිසංස්කරණය කර මේ රටේ වියතුන්ට, දාර්ශනිකයන්ට, පඬිවරුන්ට මේ දේශපාලනයට එන්නට හැකි පරිසරයක් නිර්මාණය කරලා රටට හොඳ දර්ශනයක් නිර්මාණය කිරීම තමයි අද අවශ්‍ය. ඒ පිළිබඳ හොඳ මඟ පෙන්වීමක් ඇති කිරීම තමයි නූතන විසිඑක්වන සියවසේ ඉදිරියට යන්න අපට අවශ්‍ය.

ස්තුතියි ස්වාමීන් වහන්ස.